**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 48 වගන්තිය ප්‍රකාරව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතු වුවද, බැංකු ශේෂයන්ට අදාල රු. 13,883,347 ක හර හා බැර ශේෂයන් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022/12/දින 228,044 ගිණුමට අදාළ ශේෂය රු. 311,840,780.73 කි. මුදල් පොත තුළ රු.13,883,347 ක ශේෂයක් පැවතියද කිසිසේත්ම බැංකු ජංගම ගිණුමේ අයිරා ශේෂයක් පවත්වා නොගනී. අප ආයතනය අතිරික්ත මුදල් කෙටිකාලීන අයෝජන වන Repo වල ආයෝජනය කර පොලියක් ලබා ගනී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 6,981,370 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වසරේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ආයෝජන පොලිය නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. |
| (ආ) | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කරන ලද රු.10,843,201 ක ගොඩනැගිලි වලට අදාලව රු.271,080 ක ක්ෂය වෙනුවෙන් ප්‍රතිපාදන ගිණුම් වල සලසා නොතිබුණි. | සමුච්චිත ක්ෂය අඩුවෙන් ගනණය වීම 2023 වසරේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නියමිත පරිදි ලේඛනගත කර ක්ෂය ගණනය කිරීම් සිදුකල යුතු වේ. |

### 1.5.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ ශාඛා කාර්යාල පිහිටුවීම සඳහා රජයේ ගොඩනැගිලි යොදා ගැනීමට හෝ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකර කුලී පදනම මත ලබාගෙන තිබූ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් රු 31,437,501 .ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී රජයේ ගොඩනැගිලි ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අරපිරිමැස්මෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායීව කටයුතු කල යුතුයි. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 9,190,238 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට ගෙවියයුතු ලෙස අදාල ශේෂය දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම ලැබිය යුතු මුදල නිරාකරණය කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 11 වන වගන්තිය | ආයතනය විසින් මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.1,513,150,579 ක මුදලක් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි. | මෙම රු. 1,513,150,579 ක ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇති මුදල නව ආයෝජන නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයෝජන සිදු කරනු ලබයි. | මුදල් පනතහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 03/ 2022 දරන 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය | රාජ්‍ය වියදම් පාලනය කිරීමට යටත්ව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් වසර අවසන් වන තෙක් 2022 අත්හිටුවන ලෙස දක්වා තිබුණද එයට පටහැනිව ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා වර්ෂය තුල රු. 464,328 2022 ක ආපදා ණය මුදල් ගෙවා තිබුණි. | 2023 වර්ෂයේ සිට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛහි විධිවිධාන ප්‍රකාරව ආපදා ණය සම්බන්ධව කටයුතු කල යුතු වේ. |
| (ඇ) | අංක 21/ 2015 හා 2015 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ සංශෝධිත 13.2 හා 13.5උප වගන්ති | නිලධාරියාගේ කැමැත්ත පරිදි ඕනෑම එක් වාර්ෂික උත්සවයක් සඳහා රු 10,000 .බැගින් අත්තිකාරම් මුදලක් ලබාදිය හැකි වුවත් වෛද්‍ය ආයතනයේ සේවකයන් 228 ක් වෙනුවෙන් එම සීමාව ඉක්මවා රු .3 0,000 බැගින් උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයතනයේ සේවකයන් හට මෙම උත්සව අත්තිකාරම් මුදල ගෙවීම් කරන ලදි. | චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.8 වගන්තිය | ආයතනයේ කටයුතු සඳහා අවශ්‍ය රු 31,415,000.ක සැහැල්ලු හා බර වාහන වෛද්‍ය පෝරම ලබාගැනීමේදී සියයට ක කාර්යසාධන 10 සුරක්ෂණයක් ලබාගෙන .නොතිබුණි | මේ වන විට ගිවිසුම අවසන් වන දිනය දක්වා එනම් 2023.08.06 දිනය දක්වා කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගෙන තිබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි කටයුතු කල යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 422,911,481 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 123,542,486 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 299,368,995 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයතනයේ සැහැල්ලු වාහන සහ බර වාහන රියදුරන් සඳහා නිකුත් කරන වෛද්‍ය සේවා ගාස්තුව ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෛද්‍ය ආයතනයේ ප්‍රධාන ආදායම් තුල ඇතුලත් සැහැල්ලු වාහන පරීක්ෂා කිරීමේ ආදායම් සියයට 87 ක හා බර වාහන අලුත් කිරීමේ වෛද්‍ය ගාස්තු ආදායම් සියයට 25 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 4.08 ක් වන අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය 2.1 ලෙස පැවතුණි. සමාලෝචිත වර්ෂයේ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 19 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී රු 33,499,620.ක මුදලක් සියයට ක් 12 ක් වන පොළී 5 අනුපාත යටතේ ස්ථාවර තැන්පතු වල හා රු.35,000,000ක් සියයට 9.85 ක පොළී අනුපාතිකයක් යටතේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණු අතර පවතින වෙළඳපොළ වාතාවරණය තුළ ඒ සඳහා වැඩි පොළී අනුපාතිකයක් සහිත ආයෝජනයන් සිදු කිරීමට කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | කල් පිරුණු සියළුම ස්ථාවර තැන්පතු මිලියන 140 ට 20% කට වඩා වැඩි පොළී අනුපාතය යටතේ අයෝජනය කර ඇත. | වැඩි ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කල යුතු වේ. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ කටයුතු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වෛද්‍යවරුන් ,දෙනෙකු අනුමත කර තිබුණද 75 ස්ථිර වශයෙන් වෛද්‍යවරුන් දෙනෙකු පමණක් 10 බඳවාගෙන තිබූ අතර ශාඛා කාර්යාල 20 ක් වරයෙකු හෝ සඳහා ස්ථිර පදනමින් එක් වෛද්‍යා ත් පදනම මත බඳවා නොගෙන කොන්ත්‍රා දෙනෙකු හා අර්ධකාලීන වරුන් 37වෛද්‍යා වශයෙන්(Part time) වෛද්‍යවරුන් 98 .දෙනෙකු සේවයට බඳවාගෙන තිබුණි | ආයතනය තුළ ස්ථිර වෛද්‍ය නිලධාරීන් සිටිනුයේ සුළු ප්‍රමාණයකි. එබැවින් කොන්ත්‍රාත් පදනම මත හා දෛනික පැය පදනම මත වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන සේවාලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි සේවය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි. | අනුමත කාර්යමණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමට කටයුතු කල යුතු වේ. |